සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

**භූගෝල විද්‍යාව - I**
**Geography - I**

කාලය පැය 02 යි
02 Hour

නම / විභාග අංකය:
Name/ Index No:

I කොටස

<u>සැළකිය යුතුයි.</u>

**1** කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. **11** කොටසට වෙනම කොලයක පිළිතුරු සපයන්න. **11** කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න **4** ට පිළිතුරු සැපයිය යුතුය.

➢ අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

**01)** සුළගේ වේගය මැනීම සඳහා භාවිතාවන උපකරණය කුමක්ද?
(සුළං දිශා දර්ශකය / අනිලමානය / වර්ෂාමානය)

**02)** පාසල පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය කුමක්ද?
(දිස්ත්‍රික්කය / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය / ග්‍රාම නිලධාරී කොට්ඨාසය)

**03)** පහත සත්වයින් අතරින් පස බුරුල් කිරීමට හා පස සරු කිරීමට දායක වන සත්වයා කවරෙක්ද?
(ගැඩවිලා / වේයා / ඇටි කුකුලා)

**04)** රදා වඩුන්න ප්‍රදේශය ප්‍රසිද්ධ කුමණ කර්මාන්තයටද?
(ලී බඩු / වෙස් මුහුණු / වේවැල් භාණ්ඩ)

**05)** ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන්නේ,
(පෝක් සමුද්‍ර සන්ධියෙනි / ඉන්දියන් සාගරයෙනි / ආදම්ගේ පාලමෙනි)

➢ ප්‍රශ්න අංක **6** සිට **10** දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

**06)** ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය නොමිලේ පමණක් සපයන සේවයකි. ( )

**07)** පිළිමතලාව වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. ( )

**08)** නැගෙනහිර හා දකුණු දිශාව අතර වයඹ දිශාව පිහිටා ඇත. ( )

**09)** වර්ෂාපතනය මනින ඒකකය මිලිමීටර්(mm) වේ. ( )

**10)** ශ්‍රී ලංකාවේ විශාලතම පරිපාලන ඒකකය පළාත වේ. ( )

➢ ප්‍රශ්න අංක **11** සිට **15** දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**11)** ගාල්ල දිස්ත්‍රික්කය අයත් වනුයේ,

**1.** බස්නාහිර පළාතටය. **2.** දකුණු පළාතටය.

**3.** ඌව පළාතටය. **4.** නැගෙනහිර පළාතටය.

**12)** පහත ඒවායින් කලගුණික අංගයක් නොවන්නෙ කවරක්?

**1.** උෂ්ණත්වය **2.** වර්ෂාපතනය **3.** සුළඟ **4.** නායයෑම්

**13)** දරුවකුට විධිමත් අධ්‍යාපනයක් ලබා දෙන ආයතනය කුමක්ද?

**1.** පන්සල **2.** පවුල **3.** පාසල **4.** පෙර පාසල

**14)** පහත සතුන් අතරින් කුණු කසල කා දැමීමට උදව් වන පක්ෂියා කවරෙක්ද?

**1.** ගිරවා **2.** කපුටා **3.** කොහා **4.** බකමූණා

**15)** ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් ඇති මුහුදු ප්‍රදේශය හඳුන්වන නම කුමක්ද?

**1.** අරාබි මුහුද **2.** බෙන්ගාල බොක්ක

**3.** පර්සියන් බොක්ක **4.** ඉන්දියන් සාගරය

➢ **16** සිට **20** දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

සැලැස්මක් හෝ සිතියමක් ඇඳීමේ දී එහි **16)** ........................ සටහන් කිරීම ඉතා වැදගත්ය. සිතියමක් දිශාගත කර ගැනීම සඳහා **17)** ............................ භාවිතා කරනු ලැබේ. එවැනි උපකරණයක් නොමැති අවස්ථාවක **18)** ............................ දෙස බලාද දිශාව හඳුනාගත හැකිය. හිරු උදාවන දිශාවට මුහුණ ලා දැත් දෙපසට දිගුකළ විට දකුණු අත **19)** ................................ දිශාවට පිහිටයි. ඒ අනුව වම් අත විහිදෙන්නේ **20)** .................................. දිශාවටය.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

### භූගෝල විද්‍යාව - II
### Geography - II


නම / විභාග අංකය:
Name/ Index No:

**01)** i. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම දක්වන්න. (ල. 4)

ii. අංක 1, 2,3,4 න් දක්වා ඇති මහද්වීප, හා සාගර අංක පිළිවෙලින් නම් කරන්න. (ල. 4)

iii. ශ්‍රී ලංකාවේ පිහිටීම අර්ථිකයට බලපාන ආකාරය කරුණු දෙකක් ඇසුරින් දක්වන්න. (ල. 4)

iv. ශ්‍රී ලංකාවේ වැදගත් ස්ථානයක් නම් කර එම ස්ථානය වැදගත් වීමට හේතු දෙකක් දකවන්න. (ල. 4)




**02)** i. පහත වගුව ඔබ පිළිතුරු පත්‍රයේ පිටපත් කර, ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්පඥානය මත පදනම් වූ කර්මාන්ත ඇසුරින් හිස්තැන් පුරවන්න. (ල. 8)

| කර්මාන්තය | පිහිටි ප්‍රදේශය | පිහිටි දිස්ත්‍රික්කය |
|---|---|---|
| ලී බඩු | මොරටුව | i. .................................... |
| ii. ................................. | අම්බලන්ගොඩ | iii. ................................. |
| පැදුරු | iv.................................... | v. .................................... |
| vi. ................................. | පිළිමතලාව | මහනුවර |
| vii. ............................... | රදාවඩුන්න | viii. ................................ |

ii. පාසල් සිසුවකු වශයෙන් ඔබ බුක්ති විඳින රජයේ සේවාවන් 3ක් නම් කරන්න. (ල. 3)


**03)** i. කාලගුණය නිර්වචනය කරන්න. (ල. 2)

ii. කාලගුණික තොරතුරු වැදගත්වන වෘත්තීන් 3 ක් දක්වන්න. (ල. 3)

iii. කාලගුණික අංග 4ක් මනින උපකරණය හා ඒකකය දැක්වෙන වගුවක් පිළියෙළ කරන්න. (ල. 4)

iv. ඔබ පසුගිය කාලයේ අත්විඳි කාලගුණික තත්ත්වයන් දෙකක් සඳහන් කරන්න. (ල. 2)

**04)** i. පහත අංක 1,2,3 න් දැක්වෙන නිවාස පිහිටි භූ දර්ශන අංක පිළිවෙළින් නම් කරන්න. (ල. 3)










ii. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂීන් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)

iii. ශාඛයකින් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුවක් සකස් කරන්න. (ල. 3)

iv. වෙරළබඩ පරිසරයනික් අත්වන වාසි දෙකක් දක්වන්න. (ල. 2)

**05)** i. පහත සතුන්ගෙන් ඇති ප්‍රයෝජනය බැගින් නම් කරන්න. (ල. 3)

* වවුලා * ඇටිකුකුලා * බත්කූරා

ii. පහත ජාතීන් සමඟ අදහන ප්‍රධාන ආගම් ගලපන්න. (ල. 3)

**(සිංහල, දෙමළ , මුස්ලිම්, ) ( ඉස්ලාම්, හින්දු, බෞද්ධ, කතෝලික )**

iii. ශ්‍රී ලකාවේ වෙසෙන ප්‍රධාන ජාතීන් තුනට අමතරව ජීවත්වන වෙනත් ජාතීන් දෙකක් සඳහන් කරන්න. (ල. 2)

iv. කඳුකර කලාපයෙන් අපට අත්වන වාසි තුනක් පෙන්වා දෙන්න. (ල. 3)

**06)** පහත දැක්වෙන හරස්පද ප්‍රහේලිකාව පුරවන්න. (ල. 11)

හරහට

**1.** ඝනත්වයෙන් වැඩිම ද්‍රවය
**2.** අලංකාර පක්ෂියෙකි.
**3.** පෘථිවියේ භ්‍රමණයෙන් ඇති වේ.
**4.** නත්තල සමරනුයේ මෙම බැතිමතුන්ය.
**5.** දීර්ඝ කාලයක් වැසි නොමැතිවීමෙන් මෙම තත්ත්වය උදා වේ.
**6.** දිශාව සොයා ගැනීමට උපකාරී වේ.

පහළට

**2.** මිනිසාට නැතිවම බැරි තාප ශක්තියකි.
**7.** ජල චක්‍රයේ අවස්ථාවකි.
**8.** ශ්‍රී ලංකාවේ පරිපාලන ඒකකයකි.
**9.** කුරුණෑගල දිස්ත්‍රික්කය අයත් පළාත.
**10.** සිතියමක ඇති වැදගත් මූලිකාංගයකි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 1ර | | 8දි | |
| | 2ගි | | 7වා | | | | |
| | | | | | 3රා | | |
| | | | | | | | |
| | | | 4ක | | | | |
| | | | | | | | |
| | 9ව | | | | | | 10දි |
| 5නි | | | | | | | |
| | | | | 6මා | | | |

**07)** i. පහත සේවාවන්, නොමිලයේ ලබාගතහැකි, මුදල් ගෙවා පමණක් ලබාගතහැකි, හා නොමිලයේ මෙන්ම මුදල් ගෙවා ද ලබාගතහැකි ලෙස වර්ග කර දක්වන්න. (ල. 4)

* අධ්‍යාපන * සෞඛ්‍ය * ප්‍රවාහන * තැපැල් * දූරකථන * ආරක්ෂාව

* රක්ෂණ * බැංකු * සංචාරක

ii. නොමිලයේ ලැබෙන සේවාවන් භුක්ති විඳීමේ දී ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න. (ල. 3)

iii. සංචාරක සේවය මගින් ශ්‍රී ලංකාවට අත්වන වාසි දෙකක් සඳහන් කරන්න. (ල. 2)

iv. දේශීය සංචාරකයෙන් ලෙස ඔබ සංචාරය කිරීමට වඩාත් කැමති ස්ථානයක් සඳහන් කර ඊට හේතුව සඳහන් කරන්න. (ල. 2)